# දළ දේශීය නිෂ්පාදිතය
## 2023 වර්ෂයේ පළමු කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය
### පදනම් වර්ෂය 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ පළමු කාර්තුව (ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් (2015) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

ඒ අනුව 2023 වර්ෂයේ පළමු කාර්තුවේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 7,328,574ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,114,187ක් ලෙස වාර්තා වේ. 2022 වර්ෂයේ පළමු කාර්තුව සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 5,543,306ක් සහ රුපියල් මිලියන 3,519,400 ක් වශයෙන් වාර්තා වී තිබුණි.

- 2023 වර්ෂයේ පළමු කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 11.5 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේ පළමු කාර්තුවේදී මෙම වර්ධනය සටහන් වුයේ සියයට 0.5 ක සෘණ වර්ධනයක් වශයෙනි.
- 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 0.8ක ධන වර්ධනයක්ද, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 23.4ක් සහ සියයට 5.0ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත.
- 2023 වර්ෂයේ පළමු කාර්තුවේදළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු සහ භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු පිළිවෙලින් සියයට 8.0ක්, සියයට 28.7 ක්, සියයට 58.2ක් සහ සියයට 5.1 ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.

**අන්තර්ගතය**

2023 පළමු කාර්තුවේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 8

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## 1.0 2023 වර්ෂයේ පළමු කාර්තුව සඳහා සමස්ත ආර්ථිකයේ හැසිරීම

2023 වර්ෂයේ පළමුවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 11.5 ක පසුබැසීමක් වාර්තා කර ඇති බවයි. ඒ අනුව, 2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,519,400 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී රුපියල් මිලියන 3,114,187 ක් දක්වා අඩු වී ඇත.

රූපසටහන 01
ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනය - 2022 සහ 2023 පළමු කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී රුපියල් මිලියන 5,543,306 ක් ලෙස වාර්තා වූ අතර එය 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී රුපියල් මිලියන 7,328,574 ක් දක්වා සියයට 32.2 කින් වැඩිවී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.0 ක්, සියයට 28.7 ක්, සියයට 58.2 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 5.1 ක් ලෙස වාර්තා වේ.

2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 0.8 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇති අතර කාර්මික හා සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සහ සියයට 23.4 ක් සහ සියයට 5.0 ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ඇස්තමේන්තු කෙරෙන්නේ ඊට පෙර වර්ෂයේ එනම් 2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට සාපේක්ෂව යි. 2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී කෘෂිකර්මික අංශයේ පැවති අහිතකර තත්ත්වය හා සංසන්දනය කරනවිට 2023 පළමුවන කාර්තුවේ දී එම ගැටළු යම් මට්ටමකින් විසඳී තිබුණි. 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී ආර්ථිකය තුළ මූලික වශයෙන් ම ආයෝජන දිරි ගන්වන සුළු වාතාවරණයක් නොපැවති අතර ඒ සඳහා එම කාලය තුල පැවති ඉහළ පොළී අනුපාතික හේතු විය. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදවුම් මිල වැඩිවීම නිසා බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික ඉදිකිරීම් කටයුතු අතරමග නවත්වා දැමීමේ තත්ත්වයක් දක්නට තිබූ අතර තවදුරටත් ක්‍රියාත්මක වූ ආනයන සීමා කිරීම් නිෂ්පාදන කර්මාන්ත කටයුතු සහ සේවා ආර්ථික කටයුතු සම්බන්ධයෙන් අහිතකර බලපෑම් ඇති කරන ලදි. එමෙන්ම යෙදවුම් මිල ඉහළයාම කෘෂිකාර්මික කටයුතු හා නිෂ්පාදන

කර්මාන්ත කටයුතු කෙරෙහි ද අහිතකර බලපෑම් ඇතිකර ඇත. එහි දී ශ්‍රී ලංකාවේ ඇගලුම් අපනයන 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී පහළ වැටීම විශේෂයෙන් ඉස්මතු වී පෙනේ.

2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.4 ක පසුබෑසීමක් වාර්තා කර තිබූ කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සමස්තයක් වශයෙන් සියයට 0.8 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත.

කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වාර්තා වී ඇති මෙම සුළු වර්ධනය සඳහා 'වී වගා කිරීම' (සියයට 42.1), 'මිරිදිය ධීවර කටයුතු (සියයට 16.9), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 13.0), ' කෘෂිකාර්මික සහාය සේවා කටයුතු (සියයට 10.3)', 'කුළු බඩු වගා කිරීම' (සියයට 8.8), 'පැළ බෝකිරීම' (සියයට 6.7), 'පළතුරු වගා කිරීම' (සියයට 4.4), 'එළවළු වගා කිරීම' (සියයට 1.5) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කරමින් දායකවී ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුවේ දී 'වන වගා සහ දැව කඳන් නිෂ්පාදනය' (සියයට 25.5), 'සත්ව නිෂ්පාදනය' (සියයට 11.9), 'කරදිය ධීවර කටයුතු' (සියයට 9.2), ), 'තේ වගා කිරීම' (සියයට 7.6) 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 4.8) 'රබර් වගා කිරීම' (සියයට 0.8) වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සියයට 3.7 ක පසුබෑසීමක් වාර්තා කර තිබූ සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී ද සියයට 23.4ක පසුබෑසීමක් වාර්තා කර ඇත. එහිදි 'ඉදිකිරීම් කර්මාන්තය' සහ 'පතල් හා කැනීම් කර්මාන්තය' පිළිවෙලින් සියයට 38.3 ක් සහ සියයට 45.7 ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 14.2 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර එහිදී 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 43.7), 'යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය'(සියයට 35.0), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 33.1), 'දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන'(සියයට 31.8), 'වෙනත් නිමැවුම් කර්මාන්ත'(සියයට 30.5), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 23.0), 'රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය' (සියයට 22.0), 'රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 16.2), ), 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය'(සියයට 10.2), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 8.5) සහ 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 1.4) ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත.

කෙසේ වෙතත් 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' මෙම කාර්තුවේ දී සියයට 92.9 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එය ධන වර්ධන වේගයක් වාර්තා කළ එකම නිමවුම් කර්මාන්ත ආර්ථික කටයුත්ත වේ.

එසේම 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතුරෙන් 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සහ 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' පිළිවෙලින් සියයට 15.0 ක් සහ සියයට 5.6 ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සියයට 1.8 ක ධන වර්ධනයක් වාර්තා කර තිබූ සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සියයට 5.0 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. එහිදී 'රක්ෂණ සේවා' සහ 'මූල්‍ය සේවා' පිළිවෙලින් සියයට 38.3 ක් සහ සියයට 33.2ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත. තව ද 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනි විකාශන කාර්යයන්' (සියයට 28.7), 'දේපොළ වෙළදාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 18.3), 'සෞඛ්‍ය සේවා' (සියයට 8.7), 'තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ කටයුතු' (සියයට 7.2), 'වෘත්තීය සේවා' (සියයට 4.4), 'විදුලි සංදේශ සේවා' (සියයට 4.0) 'තොග හා සිල්ලර වෙළදාම' (සියයට 1.1) යන ආර්ථික කටයුතු ද මෙම කාර්තුවේ දී සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

මේ අතර සේවා ආර්ථික කටයුතු අතුරෙන් 'නවාතැන් හා ආහාර පාන සැපයීම' (සියයට 5.2), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 4.3), 'අධ්‍යාපනය' (සියයට 3.1), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 2.8) සහ 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 1.3) වශයෙන් ධන වර්ධන වේගයන් 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2022 වර්ෂයේ පළමු කාර්තුවේ දී 157.5ක් (2015=100) ලෙස වාර්තා වන අතර 2023වර්ෂයේ පළමු කාර්තුවේ දී 235.3ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 49.4කි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( NCPI ) (2021=100) 2022 වර්ෂයේ පළමු කාර්තුවේ දී 134.0ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී 203.6ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2022 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 51.9කි.

## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී සමස්තයක් ලෙස කෘෂිකාර්මික ආර්ථික කටයුතු, 2022 වර්ෂයේ පළමු කාර්තුව හා සසඳන විට සියයට 0.8 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 585,054ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 224,946 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 8.0ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 02

කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2023 පළමු කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"ධාන්‍ය වගා කිරීම (වී හැර)" උප ආර්ථික කටයුත්ත 2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 33.1 ක පසුබැසීමට සාපේක්ෂව 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සියයට 13.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්තට අයත් ප්‍රධාන ධාන්‍ය නිෂ්පාදනයන් වන බඩ ඉරිඟු, මුං, කව්පි, උඳු, රට කජු පිළිවෙලින්, සියයට 5.6, සියයට 24.3, සියයට 10.9, සියයට 91.7, සියයට 33.8, කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ඇතැම් නිෂ්පාදනයන් 2022 පළමුවන කාර්තුවට සාපේක්ෂව පසුබැසීම් පෙන්නුම් කර ඇත.

"වී වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2022 පළමු කාර්තුව සමඟ සැසඳීමේ දී 2023 පළමු කාර්තුවේ දී සියයට 42.1 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා එකතු කළ අගය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 25,454 ක් ලෙස වාර්තාවේ.

2023 පළමු කාර්තුවේදී, 2022/2023 මහ වගා කාල සීමාවේ නිෂ්පාදන දත්ත භාවිතා කරමින් 'එළවළු වගාව' අගය එකතු කිරීම ඇස්තමේන්තු කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 'බෝග පුරෝකථනයේ' ප්‍රකාශිත තාවකාලික අගයන් යොදා ගනිමින් මෙම නිෂ්පාදනය ඇස්තමේන්තු කර ඇත. නවතම බෝග පුරෝකථන වාර්තාවට අනුව, ඇතැම් එළවළුවල

අපේක්ෂිත නිෂ්පාදනය අඩු වී ඇති අතර, සමහර එළවළු, ප්‍රධාන වශයෙන් උඩරට එළවළු නිෂ්පාදනයේ වැඩිවීමක් පෙන්නුම් කරයි. එබැවින්, 2023 පළමු කාර්තුවේදී 'එළවළු වගා කිරීමේ' සැබෑ දළ අගය එකතු කිරීම සියයට 1.5 ක ධනාත්මක වර්ධන වේගයක් වාර්තා කර ඇත. තවද, මෙම කාර්තුවේදී එළවළු නිෂ්පාදකයන්ගේ මිල ගණන්වල ඉහළයාමක් හඳුනාගෙන ඇත.

"තෙල් සහිත පලතුරු වගාව" යන ආර්ථික ක්‍රියාකාරකම ප්‍රධාන වශයෙන් පොල් වගාව, තැඹිලි වගාව හා කටුපොල් වගාව යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර පොල් වගා කිරීම ඉන් ප්‍රධාන වේ. "තෙල් සහිත පලතුරු වගාව" යන උප ආර්ථික ක්‍රියාකාරකම 2023 වර්ෂයේ පළමු කාර්තුව තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 26,022 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 0.7ක දායකත්වයක් ලබාදී ඇත. 2022 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී පොල් ගෙඩි නිෂ්පාදනය සියයට 5කින් පමණ පහළ ගොස් ඇත. එමෙන්ම 2022 පළමු කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ පොල් ගෙඩි අපනයනය සියයට 36කින් පමණ සැලකියයුතු ලෙස අඩු වී ඇති අතර තැඹිලි අපනයනය ද සියයට 22කින් වැඩි වී ඇත. 2023 වර්ෂයේ පළමු කාර්තුවේදී "තෙල් සහිත පළතුරු වගා කිරීම" යන සමස්ත ආර්ථික කටයුත්ත සියයට 4.8ක පසුබැස්මක් වාර්තා කර ඇත.

"තේ වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2023 පළමු කාර්තුවේ දී සියයට 7.6 ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ පළමු කාර්තුවේ දී සියයට 14.7 ක පසුබැස්මක් වාර්තා කර ඇත. 2023 පළමු කාර්තුවේ දී "නිමි තේ" නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 7.6 ක පසුබැස්මක් වාර්තා කර ඇත. කොළඹ වෙළෙඳපොළෙහි නිමි තේ කිලෝවක සාමාන්‍ය මිළ, පසුගිය වසරේ මෙම කාර්තුව හා සැසඳීමේ දී රු. 763.83 සිට රු. 1,395.56 දක්වා සියයට 82.7 ක වර්ධනයක් වාර්තාවී ඇත. තේ නිෂ්පාදනය සඳහා සියයට 62.8 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහතරට තේ නිෂ්පාදනය සියයට 3.7 ක පසුබැස්මක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

"රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සියයට 0.8 ක පසුබැස්මක් ද රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 2.5 ක පසුබැස්මක් ද 2023 පළමු කාර්තුවේ දී වාර්තා කර ඇත. 2022 පළමු කාර්තුවේදී "රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සියයට 13.0 ක හා රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 15.7 ක පසුබැස්මක් වාර්තාවී ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 පළමු කාර්තුවේ තොරතුරු වලට අනුව, සකස් කළ රබර් කිලෝග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයෙහි සාමාන්‍ය මිළ රු. 658.34 සිට රු. 543.72 දක්වා සියයට 17.4 ක පසුබැස්මක් වාර්තාවී ඇත.

"අනෙකුත් ස්ථිර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම, රා මැදීම සහ කොට්ටකිලංගු වගා කිරීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2022 වර්ෂයේ පළමුවෙනි කාර්තුවට සාපේක්ෂව මෙම සමස්ත ආර්ථික කටයුත්ත ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 6,490 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 1.4 ක පසුබෑමක් වාර්තා කර ඇත.

'සත්ත්ව නිෂ්පාදනය'යන ආර්ථික කටයුත්ත කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 20,379 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 1.3 ක දායකත්වයක් ලබාදී ඇත. මෙම කාර්තුව තුළ දී සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2022 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව සියයට 11.9 ක සැලකිය යුතු පසුබැස්මක් වාර්තා කර ඇත. සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්වේ දත්ත වලට අනුව මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම සියයට 6.5 ක, බිත්තර නිෂ්පාදනය සියයට 32.1 ක හා කිරි නිෂ්පාදනය සියයට 1.0 කින් අඩු වී ඇත. එමෙන්ම 2022 පළමු කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළදී මස් පිණිස ඇති කරන සියලුම සතුන්ගේ මිල, දියර කිරි ලීටරයක මිල, බිත්තර සඳහා මිල යන නිෂ්පාදකයාගේ මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

"පැළ හා බීජ ප්‍රවර්ධනය" යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ රට තුළ පොල්, තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, මල් හා පලතුරු යන පැළ වර්ග නිෂ්පාදනය කිරීමයි. 2022 පළමු කාර්තුවට සාපේක්ෂව මෙම වර්ෂයේ පළමු කාර්තුව තුළදී ස්ථාවර (2015) මිල ගණන් යටතේ රුපියල් මිලියන 180 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 6.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත.

කෘෂි සහායක කාර්යයන් යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා වී වගාවේදී, කුඹුරු බිම් සකස් කිරීමේදී හා අස්වනු නෙලීමේදී පිලිවෙලින් රෝද හතරේ හා රෝද දෙකේ ට්‍රැක්ටර් මෙන්ම ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍ර (Combined Harvestor) යොදා ගනු ලබයි. එම සේවය ලබා දීම තුලින් ආර්ථිකයට ජනනය වන වටිනාකම මෙහිදී සලකනු ලබයි. එය මෙම ආර්ථික කටයුත්තෙහි ප්‍රධාන සංරචකයි. ඊට අමතරව ධාන්‍ය වගා භෝග කිහිපයක් හා උඩරට එළවළු භෝග කිහිපයක් සඳහා එලෙස පස සකස් කිරීමට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ පිරිවැය ඔස්සේ ඒ සඳහා වන යාන්ත්‍රික සහායක සේවා සැපයුම මීට එකතු කරනු ලබයි. මේ අනුව 2023 වසරේ පළමු කාර්තුවේ දී, මෙම ආර්ථික කටයුත්ත සියයට 10.3 ක වර්ධනයක් පෙන්නුම්

කොට ඇත. මෙම ආර්ථික කටයුත්තට අදාල වර්ධනය ගණනයට පාදක වන ස්ථාවර මිළ අනුව එකතු කල අගය (Constant Values Added) රුපියල් මිලියන 10,043 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. පෙර වසරේ පළමු කාර්තුවේ ස්ථාවර මිළ අනුව එම අගය රුපියල් මිලියන 9,103 ලෙස වාර්තා වී ඇත. ඉන්ධන මිළ ඉහළ යාම හේතුවෙන් හා combined harvestor හා ට්‍රැක්ටර් වෙනුවෙන් වන යෙදවුම් වල මිළ ගනන් ඉහළ යාම නිසා ඒ සඳහා අය කරනු ලබන සේවා ගාස්තු ඉහළ යාමෙන් පවත්නා මිළ අනුව ගණනය කල එකතු කල අගය (Current Value Added) රුපියල් මිලියන 15,069 ක් ලෙස ඉහළ ගොස් ඇත. පසුගිය වසරේ පළමු කාර්තුව සඳහා ගණනය කල එම අගය රුපියල් මිලියන 10,182 ක් විය.

"වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය" යන උප කෘෂිකාර්මික ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය නියෝජනය වන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිෂ්පාදනය තුලින් ජනනය වන වටිනාකමයි. මෙම කාර්තුවේදී දර නිෂ්පාදනයේ යම් වැඩි වීමක් අපේක්ෂා කළ හැකි නමුත් දැව කඳන් නිමැවුමෙහි පහළ යෑමක් නිරීක්ෂණය වේ. පැවති LP ගෑස් මිළ වැඩි වීම හේතුවෙන් ගෘහස්ථ ගෑස් භාවිතයේ යම් අඩු වීමක් 2022 වසර පුරා අත්දකින්න ලැබුණි. තවදුරටත්පසුගිය වසරේ පළමු කාර්තුවට වඩා රටේ දර පරිභෝජනය යම් ඉහළ යාමක් නිරීක්ෂණය කළ හැක. එම ඉල්ලුම සපුරාලීමට රටේ දර නිමැවුම ඉහළ ගොස් ඇත. කෙසේ වුවත් රාජ්‍ය දැව සංස්ථාවේ දැව කඳන් නිෂ්පාදනය මෙම කාර්තුවේ සියයට 46 ක අඩු වීමක් වාර්තා වී ඇත. තවද ඉදිකිරීම් කර්මාන්තයේ දක්නට ලැබුණු විශාල පසු බෑම හේතුවෙන් ඒ සඳහා යෙදවෙන දැව යෙදවුම්වල අඩු වීමක් අපේක්ෂා කළ හැකිය. එම තත්ත්වයම ගෘහ භාණ්ඩ නිෂ්පාදනයේ අඩු වීම තුළ දක්නට හැකිය. ඒ අනුව මෙම ආර්ථික කටයුත්ත තුළ සියයට 25.5 ක පසුබෑමක් 2023 පළමු කාර්තුවේදී ඇස්තමේන්තු කොට ඇත.

2022 පළමු කාර්තුවට සාපේක්ෂව 2023 පළමු කාර්තුවේ දී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්ත එකතුකළ අගය සියයට 9.2ක පහල යෑමක් දක්නට ලැබේ. මෙම ආර්ථික කටයුත්ත 2022 පළමු කාර්තුවේදී දී පවත්නා මිළ අනුව එකතුකළ වටිනාකම රුපියල් මිලියන 69,191 ක් වන අතර දළ දේශීය නිෂ්පාදිතය තුළ සියයට 0.9 ක දායකත්වයක් දරයි. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා වලට අනුව 2023 පළමු කාර්තුවේදී, 2022 පළමු කාර්තුවට සාපේක්ෂව වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය සියයට 17.8ක පහල යෑමක් හා ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 4.5 ක ඉහළ යෑමක් සහ සමස්ත කරදිය මතස්‍ය නිෂ්පාදනය සියයට 9.1ක පහළ යෑමක්පෙන්නුම් කරයි. මෙසේ වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනයේ පහළ යෑම නිසා සමස්ත කරදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 4.1 ක පහළ යෑමක් 2023 පළමු කාර්තුවේදී පෙන්නුම් කරයි. ධීවර මෙහෙයුම් සඳහා වැයවන අධික පිරිවැය හේතුවෙන් ධීවර මෙහෙයුම් සීමා කිරීමට සිදුවීම මෙයට බලපා ඇත.

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවි වගාව ආර්ථික කටයුත්ත එකතුකළ වටිනාකම් 2022 පළමු කාර්තුවට සාපේක්ෂව 2023 පළමු කාර්තුවේදී සියයට 16.9 ක ඉහලයෑමක් වාර්තා වේ.

## 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

2022 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2023 වසරේ පළමු කාර්තුවේ දී සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 23.4ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,105,796 ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 809,638 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 28.7ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

2023 වර්ෂයේ පළමුවන කාර්තුවේදී "පතල් හා කැනීම්" කර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.6ක දායකත්වයක් දක්වා ඇති අතර සියයට 45.7 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්, මැණික් කැනීම් හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් වශයෙන් කාණ්ඩ තුනකින් සමන්විත වේ. සමස්ත පතල් හා කැනීම් ආර්ථික කටයුත්තේ දළ එකතුකළ වටිනාකමෙන් සියයට 82.1ක පමණ ප්‍රමාණයක් ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් මගින් ලබා දෙන අතර එය 2023 වර්ෂයේ පළමුවන කාර්තුවේ දි සියයට 49.4 ක පහළ යාමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් සියයට 31.6ක පහළ යාමක් සහ මැණික් කැනීම් සියයට 5.4ක ධන වර්ධනයක් වාර්තා කර තිබුණද ඉහළ දායකත්වයක් සපයන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් සම්බන්ධයෙන් වාර්තා වී ඇති සෘණ වර්ධනය හේතුවෙන් මෙම ආර්ථික කටයුත්තේ සමස්තයක් වශයෙන් පසුබෑසීමක් වාර්තා වී ඇත.

රූපසටහන 03

කාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2023 පළමු කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම' ක්‍රියාකාරීත්වය 2022 එම කාර්තුවේ වාර්තා වූ සියයට 6 ක ධන වර්ධනයට සාපේක්ෂව 2023 පළමු කාර්තුවේදී සියයට 15ක අඩුවීමක් වාර්තා කර ඇත. මෙම කාර්තුවේදී විකුණුම් ප්‍රමාණය සියයට 12ක අඩුවීමක් දක්නට ලැබුණද 2022 පළමු කාර්තුවට සාපේක්ෂව විකුණුම් අගයෙහි සියයට 88ක වැඩිවීමක් තුලින් විදුලි මිලෙහි සිදුවූ වැඩිවීමක් පෙන්නුම් කර ඇත. විදුලිබල උත්පාදන සමස්ත ජනනය සියයට 12 කින් පමණ අඩුවී ඇති අතර මේ අතර තාප විදුලිය නිෂ්පාදනය සියයට 19 කින් පමණ අඩුවී ඇත. තවද 2022 පළමු කාර්තුවේදී ජල, තාප සහ NCRE බලශක්ති උත්පාදනය අතර අනුපාතය 22:66:12 ලෙස වාර්තා වූ අතර එය 2023 පළමු කාර්තුවේදී 25:61:14 දක්වා වෙනස් වී ඇත.

2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී "ජලය එක්රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම" යන උප ආර්ථික කටයුත්ත සියයට 5.6 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත.

2022 පළමු කාර්තුව හා සසඳන විට 2023 පළමු කාර්තුවේදී 'ඉදිකිරීම්' ක්‍රියාකාරකම් සියයට 38.3 කින් අඩු වී ඇත. මෙම කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ඉදිකිරීම් කටයුතුවල කොටස සියයට 5.7 ක් ලෙස වාර්තා වී ඇත. එමෙන්ම 2023 පළමු කාර්තුව තුළ සමස්ත සිමෙන්ති සැපයුම සියයට 46.93 කින් පහත වැටී ඇති අතර සිමෙන්ති ඇතුළු සියලු ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම මෙම සෘණ වර්ධනයට හේතු වී තිබේ.

### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

2022 පළමු කාර්තුවේදී නිෂ්පාදන ක්‍රියාකාරකම්හි සියයට 6.7 ක හැකිලීමක් දක්නට ලැබුණු අතර 2023 පළමු කාර්තුවේදී ද සියයට 14.2 ක සැලකිය යුතු හැකිලීමක් දක්නට ඇත. කෙසේ වෙතත්, සමස්තයක් ලෙස සළකා බලන විට නිෂ්පාදන කටයුතු සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20.5 ක් විය. 2022 පළමු කාර්තුව හා සංසන්දනය කර බලන විට 2023 එම කාර්තුවෙ නාමික මිල ගණන් යටතේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 1,502,728 ක් වූ අතර ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 524,058 ක් ලෙස වාර්තා විය.

නිෂ්පාදන ක්‍රියාකාරකම් තුළ විශාලතම උප ක්‍රියාකාරකම්, එනම් 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය', සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට සියයට 7.8 ක දායකත්වයක් ලබා දුන් නමුත් 2023 පළමු කාර්තුවේ දී සියයට 10.2 ක හැකිලීමක් වාර්තා වී ඇත. දෙවන විශාලතම නිෂ්පාදන ක්‍රියාකාරකම වන රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදනය' 2022 පළමු කාර්තුවේදී සියයට 0.8 ක වර්ධනයක් දක්නට තිබුණ අතර 2023 පළමු කාර්තුවේදී සියයට 8.5 ක පසුබෑමක් වාර්තා වී ඇත.

''ගල් අඟුරු සහ පිරිපහදු කළ පෙට්‍රෝලියම් නිෂ්පාදන නිෂ්පාදනයේ උප ක්‍රියාකාරකම් 2023 පළමු කාර්තුවේදී සියයට 92.9 ක සැලකිය යුතු ඉහළ වර්ධන වේගයක් වාර්තා වී ඇති අතර එය 2022 පළමු කාර්තුවේදී සියයට 23.8 ක හැකිලීමක් වාර්තා කර ඇත.

අනෙකුත් සියලුම නිෂ්පාදන කටයුතු සලකා බැලීමේදී, ඒවායින් බොහොමයකම සංකොචනයන් වාර්තා වී ඇත. 'ගෘහ භාණ්ඩ හැර ලී නිෂ්පාදනය සහ ලී සහ කිරළ නිෂ්පාදනය' (සියයට -31.8), 'රසායනික නිෂ්පාදන සහ ඖෂධ නිෂ්පාදන නිෂ්පාදනය' (සියයට -22.0), ' රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන නිෂ්පාදනය' (සියයට -16.2), 'අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන නිෂ්පාදනය' (සියයට -23.0), 'මූලික ලෝහ සහ සකස් කරන ලද ලෝහ නිෂ්පාදනය' (සියයට -43.7), 'යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය' (- සියයට 35.0), සහ 'වෙනත් නිෂ්පාදන සහ අලුත්වැඩියා' (සියයට -30.5). ලෙස මෙම කාර්තුව තුළ දී ඉහත සඳහන් නිෂ්පාදන ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන සංකෝචනයන් වාර්තා විය.

### 1.3 සේවා ආර්ථික කටයුතු

2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 5.0ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 4,266,900ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 1,934,824 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 58.2ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 04
සේවා ආර්ථික කටයුතුවල වර්ධනය - 2023 පළමු කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"තොග සහ සිල්ලර වෙළඳාම" 2023 පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 14.9ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2022 පළමු කාර්තුවේ වාර්තාවූ සියයට 0.9ක ධන වර්ධනය හා සැසඳීමේදී 2023 පළමු කාර්තුවේදී ද සියයට 1.1ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරයි. දේශීය කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය සහ කාර්මික භාණ්ඩ නිෂ්පාදනයඅඩුවීමත්, ආනයන භාණ්ඩ අඩුවීම සහ මිලදී ගැනීමේ හැකියාව අඩුවීම මෙම සෘණ වර්ධනයට හේතු විය.

"තොග හා සිල්ලර වෙළඳාම" යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාමට අමතරව ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, විද්‍යුත් උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ වෙළෙඳාම යනාදිය ආවරණය කරයි.

භාණ්ඩ ආනයන සහ තොග හා සිල්ලර වෙළෙන්දන් හරහා පාරිභෝගිකයන් අතට පත්වන දේශීය භාණ්ඩ නිෂ්පාදිතයේ උච්චාවචනයන් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2022 පළමු කාර්තුව සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 1,237,881 වූ අතර 2023 පළමු කාර්තුව සඳහා එය රු. මිලියන 1,350,197 දක්වා සියයට 9.1කින් වැඩිවී ඇත. එසේම, මෙම කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2022 වර්ෂයේ පළමු කාර්තුවේ පැවති රු. මිලියන 204,943 සිට රු. මිලියන 240,025 දක්වා සියයට 17.1කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2022 පළමු කාර්තුව හා සසඳන විට 2023 පළමු කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 25.8කින් ද, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 22.6කින් ද අඩුවී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2022 පළමු කාර්තුව හා සසඳන විට 2023 පළමු කාර්තුවේදී ලෝකයේ සෙසු රටවල් වෙත යොමු වූ මුළු අපනයන වටිනාකම සියයට 47.4කින් වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 3.9කින් වැඩිවී තිබේ. එහිදී

මෙම කාර්තුවේදී කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 8.6 කින් අඩුවී ඇති අතර කාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 6.3කින් වැඩිවී ඇත.

“මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම” යන සේවා ආර්ථික කටයුත්ත, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික කාර්යයන් ගෙන් සමන්විත වේ. 2023 පළමු වන කාර්තුවේ දී ගොඩබිම් ප්‍රවාහන කටයුතු ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ පළමු වන කාර්තුව ට සාපේක්ෂව, පොදු මගී ප්‍රවාහන සේවා ධන වර්ධනයක් වාර්තා කිරීම මේ සඳහා බලපා ඇත. මේ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, දුම්රිය දෙපාර්තමේන්තුව හා ජාතික ගමනාගමන කොමිසම මගින් සකසනු ලබන මගී කිලෝ මීටර් ප්‍රමාණය පිළිවෙලින් සියයට 18.0, 53.4, 19.3 ලෙස වැඩි වී ඇත. මෙම කාර්තුවේ දී ගුවන් ප්‍රවාහනය ද ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ශ්‍රී ලංකා ගුවන් සමාගමේ මගී කිලෝ මීටර් සංඛ්‍යාව සියයට 31.3 කින් වර්ධනය වී ඇත. ගබඩා පහසුකම් සැපයීම සහ අනෙකුත් ප්‍රවාහන සහය සේවා කටයුතු 20.2 ක ඍණ වර්ධනයක් වාර්තා කර ඇත. මේ අනුව සමස්තයක් වශයෙන් ප්‍රවාහන කටයුතු 2022 වර්ෂයේ පළමු වන කාර්තුවට සාපේක්ෂව 2023 පළමු වන කාර්තුවේ දී සියයට 2.8 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

තැපැල් සහ කුරියර් ක්‍රියාකාරකම්වල උප ක්‍රියාකාරකම් පසුගිය වසරේ එම කාර්තුවට සාපේක්ෂව 2023 පළමු කාර්තුවේදී සියයට 4.3 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම කාර්තුවේ කුරියර් ක්‍රියාකාරකම් ඉහත සඳහන් ධනාත්මක වර්ධනයට ප්‍රධාන දායකත්වයක් විය. එසේ වුවද, තැපැල් දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව මෙම කාර්තුවේදී ඔවුන්ගේ කාර්ය මණ්ඩල පිරිවැය සියයට 1.7 කින් අඩු වී ඇත.

“නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම” යන ආර්ථික කටයුත්ත 2022 පළමු කාර්තුවේ වාර්තා කල සියයට 24.0 ක වර්ධනයට සාපේක්ෂව 2023 පළමු කාර්තුවේදී දී සියයට 5.2 කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) වාර්තා අනුව 2022 පළමු කාර්තුවේදී දී විදේශීය සංචාරකයන් 285,334 පැමිණ තිබූ අතර එය 2023 පළමු කාර්තුවේදී දී 335,679 ලෙස වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 පළමු කාර්තුව තුළ කාර්තුමය පිරිවැටුම 2022 පළමු කාර්තුවේ කාර්තුමය පිරිවැටුම හා සසඳන විට සියයට 48.8 කින් වැඩි වී ඇත.

'වැඩසටහන්කරණය සහ විකාශන ක්‍රියාකාරකම් සහ ශ්‍රව්‍ය වීඩියෝ නිෂ්පාදන' හි උප ක්‍රියාකාරකම් පෙර වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2023 පළමු කාර්තුවේදී සියයට 28.7 ක හැකිලීමක් වාර්තා කර ඇත. මෙම ක්‍රියාකාරකම තුළ කොටස් දෙකටම අදාළ අගය එකතු කිරීමේ අඩුවීමක් පෙන්නුම් කළද, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය නිෂ්පාදනය මෙම කාර්තුවේ විශාල අඩුවීමක් පෙන්නුම් කළේය. එපමණක් නොව බොහෝ ජනප්‍රිය රූපවාහිනී සමාගම්වල ආදායම් වාර්තා ඔවුන්ගේ ආදායමේ අඩුවීමක් පෙන්නුම් කළේය.

2022 වර්ෂයේ පළමු කාර්තුවේ දී “විදුලි සංදේශ සේවා සැපයීම” උප ආර්ථික කටයුත්ත සියයට 7.9 ක ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇති නමුත් 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී. සියයට 4.0 හැකිලීමක් දැක ගත හැක. ඊට හේතුව, පසුගිය වසර කිහිපය පුරාම මෙම ආර්ථික කටයුත්ත ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර දුරකථන ගාස්තු වැඩිවීම නිසා පසුගිය වසරේ සිට දුරකථන භාවිතයේ අඩු වීමක් දැක ගත හැක. 2023 වර්ෂයේ රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සියයට -10.1 කින් අඩු වී ඇති අතර ජංගම දුරකථන සම්බන්ධතා සියයට 7.7 කින් අඩු වී ඇත. තවද අන්තර්ජාලය සහ ඊ - තැපැල භාවිතා කරන සම්බන්ධතා ප්‍රමාණය 2023 වර්ෂයේ දී පළමු කාර්තුවේ දී සියයට 1.9 කින් අඩු වී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.8 ක දායකත්වයක් සපයන තොරතුරු තාක්‍ෂණය (IT) සහ තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ සේවා (ITES) ඇතුළු “පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්”, 2022 පළමුවන කාර්තුව හා සසඳන විට මෙම කාර්තුවේ දී සියයට 7.2 ක හැකිලීමක් වාර්තා කර ඇත. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස දක්ෂ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ සංක්‍රමණය ඉහළ වේගයකින් ඉහළ ගොස් ඇති අතර එය තොරතුරු තාක්ෂණ කර්මාන්තයට ද අහිතකර ලෙස බලපා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2022 පළමුවන කාර්තුව හා සසඳන විට 2023 පළමුවන කාර්තුවේ දී පරිගණක සේවාවලින් උපයන ලද අපනයන ආදායමේ වටිනාකම රු. මිලියන 61,816 සිට රු. මිලියන 86,002 දක්වා වැඩි වී ඇත. එයට බොහෝ දුරට හේතු වී ඇත්තේ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වීමයි. කෙසේ වෙතත්, 2022 පළමුවන කාර්තුව හා සසඳන විට 2023 පළමුවන කාර්තුව තුළදී එක්සත් ජනපද ඩොලරයේ අගයෙන් පරිගණක සේවා අපනයන ආදායම ඩොලර් මිලියන 281 සිට ඩොලර් මිලියන 245 දක්වා සියයට 13.0 කින් අඩු වී ඇත.

මූල්‍ය සේවා සැපයීම” ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ශ්‍රී ලංකාවේ ගෘහ නියෝජනය කරන පුද්ගලයින් විසින් සපයනු ලබන මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්හි දත්ත උපයෝගී

කර ගනී. මෙම ආර්ථික කටයුත්ත 2022 පළමුවන කාර්තුවට සාපේක්ෂව 2023 පළමුවන කාර්තුවේ සියයට 33.2ක ඍණාත්මක වර්ධනයක් වාර්තා වේ. එම වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) සියයට 51.9කින් පමණ විශාල ලෙස ඉහල යැමයි. මෙම කාර්තුවේදී ස්ථාවර මිල ගණන් යටතේ එකතුකළ අගය රුපියල් මිලියන 110,516 ක් වූ අතර එය 2022 පළමුවන කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 165,334 ට වඩා පහළ අගයක් ගනී. මුල්‍ය සේවාවන්හි භාවිතාව, ණය හා අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව 2023 පළමුවන කාර්තුවේ ණය අත්තිකාරම් වටිනාකම සියයට 6 කින් අඩුවී ඇති අතර මුළු තැන්පතු වටිනාකම 7.7කින් වර්ධනය වී ඇත. 2023 පළමුවන කාර්තුවේ "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය" සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය" පිලිවෙලින් සියයට 18.3ක් සහ සියයට 15.1ක් ලෙස සටහන් විය.

"රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ" කටයුතු වල මූර්ත එකතුකළ අගය 2023 පළමු කාර්තුවේදී සියයට 38.3 ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ පළමු කාර්තුවේ දී සියයට 23.8 ක පසුබැස්මක් වාර්තා කර ඇත.  රක්ෂණ සේවාව භාවිතය මැන දක්වන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම හා උපයන ලද හිමිකම් වටිනාකමෙහි එකතුව මෙම කාර්තුවේ දී සියයට 10.0 කින් වර්ධනය වී ඇත. එමෙන්ම මෙම කාර්තුවේදී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (NCPI) අගය සියයට 51.9 කින් වර්ධනයවී ඇත.

"දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" 2022 පළමු වන කාර්තුවට සාපේක්ෂව 2023 වසරේ  පළමු වන කාර්තුවේ දී සියයට 18.3 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය රුපියල් මිලියන 142,165 ක් වන අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.9 ක දායකත්වයක් මෙම ආර්ථික කටයුත්ත මගින් ලැබේ.

වෘත්තීය සේවා උප ආර්ථික කටයුත්ත 2023 වර්ෂයේ පළමු කාර්තුවේදී ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 65,349ක් වාර්තා කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.5 ක පමණ දායකත්වයක් ලබාදී ඇත. මෙම ආර්ථික කටයුත්තෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් "නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහ නිර්මාණ හා ඉංජිනේරු කාර්යයන්", "විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්", "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන් සහ ප්‍රකාශන කාර්යයන්", "පශුවෛද්‍ය කාර්යයන්", "කුලී හා බදු කාර්යයන", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්" සහ "ගොඩනැගිලි හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්" ගෙන් සමන්විත වේ. මෙම කාර්තුව තුලදී මෙම ආර්ථික කටයුතු නිමැවුම් අගය ගණනය කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන එකතුකල අගය මත පනවන බදු දත්ත වලට අනුව වේ. වෘත්තීය සේවා 2022 පළමු කාර්තුවට සාපේක්ෂව 2023 පළමු කාර්තුවේ දී සියයට 4.4 ක පහළ යාමක් වාර්තා කොට ඇත.

2023 පළමු කාර්තුවේදී මානව සෞඛ්‍ය සේවා අංශය සැලකිය යුතු පසුබැසීමක් වාර්තා කර ඇත. මෙම අංශයේ වර්ධන වේගය සියයට -8.7 ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසරේ එම කාලයට සාපේක්ෂව ආර්ථික ක්‍රියාකාරකම්වල හැකිලීමක් පෙන්නුම් කරයි. සෞඛ්‍ය සේවා අංශයේ මෙම පහත වැටීම සැලකීමේදී කර්මාන්තය මුහුණ දෙන අභියෝග සහ බාධාවන් පිළිබිඹු කරයි. සෞඛ්‍ය පහසුකම්, රෝහල්, සායන, ඖෂධ සහ ඒ ආශ්‍රිත සේවාවන් ඇතුළත් වන මෙම අංශය තුළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ අඩුවීම මෙම සෘණ වර්ධන වේගයට හේතු වී ඇත. 'කොළඹ කොටස් වෙළඳපොලේ' ලියාපදිංචි කර ඇති දිවයිනේ ප්‍රධාන රෝහල් හයක ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන්ගේ පළමු කාර්තුවේ (ජනවාරි සිට මාර්තු දක්වා) දත්ත අනුව, එම රෝහල්වල කාර්තුමය පිරිවැටුම 2022 වසරේ පළමු කාර්තුවේ මූල්‍ය ප්‍රකාශන (ජනවාරි සිට මාර්තු දක්වා) දත්ත හා සසඳන විට සියයට 20.1 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම, මෙම කාර්තුව තුළදී ඊ චැනලින් සේවාවන් සියයට 11.4 වැඩි වීමක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුව තුළ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සෞඛ්‍ය උප දර්ශකයට අනුව එහි දර්ශක අගය 160.6 සිට 254.1 දක්වා සියයට 58.2 කින් ඉහළ ගොස් ඇත. එය 2022 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව 2023 වර්ෂයේ පළමු කාර්තුවෙහි සෞඛ්‍ය අංශයේ මිල මට්ටම්වල තියුණු වැඩිවීමක් පෙන්නුම් කරයි

වර්තන මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට සියයට 8.3 ක දායකත්වයක් සපයන "අනෙකුත් පුද්ගලික සේවා ක්‍රියාකාරකම්"යන ආර්ථික කටයුත්ත "කලා සහ පොදු විනෝදාස්වාදය", "වෙනත් පුද්ගලික ක්‍රියාකාරකම්" සහ "සේවායෝජකයන් ලෙස ඇති ගෘහ ඒකක වල කටයුතු" යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. 2022 පළමු කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දි භාණ්ඩ ආනයනය සීමාකර තිබීම නිසා අමුද්‍රව්‍ය හිගවීම හා මිල ඉහල යාම විශාල වශයෙන් බලපෑම් සිදුකල අතර ඒ හේතුන් නිසා වාර්තා වන්නේ සියයට 1.3 ක් වැනි සුළු වර්ධනයකි.

| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර |
|---|---|
| දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම | ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වුත් නිවැරදි වුත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සංඛ්‍යාන මන්දිරය

අංක.306/71,පොල්දූව පාර

බත්තරමුල්ල

info@statistics.gov.lk

+94 11 2147000

+94 11 2147011

statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

පළමු මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

National.accounts@statistics.gov.lk

+9411 2147071 +94 112877938